

අලි මිනිස් ගැටුම

අලි මිනිස් ගැටුම පසුගිය කාලය තුළ කෙතරම් බරපතල ප්‍රශ්නයක් බවට පත් වූයේ ද කිවහොත් එයට කඩිනම් විසඳුම් සොයන ලෙස වන සත්වාරක්ෂක නිලධාරීන්ට පෞද්ගලිකව ම උපදෙස් දීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට සිදු විය. මිනිසුන්ගේ සහ අලි ඇතුන්ගේ මූලික අවශ්‍යතාවලට අවහිරයක් නොවන සේ ප්‍රශ්නයට විසඳුම් සොයන ලෙස එතුමා නිලධාරීන්ට නියෝග කළේ ය.

සී.පී. කුරුප්පු

මේ අතර යාල සහ ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ පවතින අල මිනිස් ගැටුම් අවම කිරීම පිණිස පාරිසරික සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය නව ව්‍යාපෘතියක් ඇරැඹීය. එය නියාමක ව්‍යාපෘතියකි. එය සාර්ථක වුවහොත් වෙනත් අභය භූමි සහ ආරක්ෂිත වන ප්‍රදේශවලටද එය ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වනු ලැබේ. මෑතදී උත්සන්න වී ඇති අලි මිනිස් ගැටුම් සැලැකිල්ලට ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ බව පවසන පාරිසරික ඇමැති චම්පික රණවක මහතා, මෑතදී අරඹන ලද අලි ඇතුන් ආරක්ෂා කිරීමේ අරමුදල මඟින් මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යන බව කීය. යාල සහ ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ අලි ඇතුන්ගේ හැසිරීම් රටාව සැලැකිල්ලට ගෙන මෙම ව්‍යාපෘතියේ ඇතැම් අංශ වැඩි දියුණු කළ හැකි යැයි ඇමතිවරයා පැවසීය.

අලි ඇතුන් සංරක්ෂණය අලි මිනිස් ගැටුම නමැති පොදු ප්‍රශ්නය තුළ දැකිය හැකි සුවිශේෂී ප්‍රවණතාවකි.

මෙය අලුත් ප්‍රශ්නයක් නොවේ. එය මිනිසුන් සහ අලි ඇතුන් එකට ජීවත් වීමේ දී ඉතිහාසය පුරා දැක ගත හැකි වූ ප්‍රශ්නයකි. කැලෑව අලි ඇතුන්ගේ වාස භූමියයි. මිනිසුන් කැලෑව හෙළි පෙහෙළි කර වගා කටයුතුත් ජනාවාස ඇරැඹීමත් සමඟ මෙම ප්‍රශ්නය උත්සන්න වන්නට විය. මිනිස්සු අලි ඇතුන් වසන කැලෑ බිම් හෙළි පෙහෙළි කිරීම අදටත් කරති.

මෙරට කැලෑවල සහ අභය භූමිවල අද වසන අලි ඇතුන්ගේ සංඛ්‍යාව 2000 ක් පමණ වෙයි. මේ අතර එක් මසක් ඇතුළත ඔවුන් ගෙන එක් සියයක් පමණ මරණයට පත් වන බව ගණන් බලා තිබේ. එම මරණ වලින් ඉතා වැඩි සංඛ්‍යාවක් මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවෙයි. ඒවා අතර වෙඩි තැබීම්, දුම්රියට යට වීම් සහ මිනිසුන් විසින් කැපූ වළවලට වැටීමද වෙයි.

කැලෑ එළි කර නව කෘෂිකර්ම ව්‍යාපාර ඇරැඹීමත් වගා කටයුතු සඳහා කැලෑව එළි කිරීම සහ නව ජනාවාස ඇති කිරීමත් නිසා ඇලි ඇතුන් කෑම සොයා යන බිම් ප්‍රදේශය සීමා වෙයි.

අලුතින් අරඹන ලද ජනාවාස සමහරක් අලි ඇතුන්ගේ වාස භූමි තුළ පිහිටා තිබේ. තවත් ජනාවාස පිහිටා ඇත්තේ එත් අභය භූමියක සිට තවත් අභය භූමියක් දක්වා අලි ඇතුන් ගමන් ගන්නා පටු බිම් තීරුවලය. ජනාවාස අසල කැලෑවල සිටින අලි ඇතුන් එම කැලෑවලින් ඉවත්කර අභය භූමිවලට රැගෙන ගොස් මුදා හරිනු ලැබුවත් ඔවුන් මුලින් රැඳී සිටි කැලෑවලට යළි පැමිණීමේ ප්‍රවණතාවක් දැකිය හැකිය.

අලි ඇතුන්ට මිනිසා නිසා සිදුවන සාමාන්‍ය අනතුරුවලට අමතරව දළ ලබා ගැනීම සඳහා ඇතුන් දඩයම් කිරීම අද පවා අසන්නට ලැබෙයි. අලි ඇතුන්ට මුහුණ පෑමට සිදුවී ඇති ඉරණම ගැන වන සත්වලොලීන් සතුටු නොවන නමුත් මෙම සතුන්ගේ අනාගත පැවැත්ම වෙනුවෙන් කෑගල්ලේ පින්නවල අලි අනාථාගාරය සහ උඩ වලවේ ඇත් අතුරු සෙවන ඇරැඹීමත් ගැන ඔවුන් සතුටු වනු ඇත.

අලි ඇතුන් ප්‍රොබොසිඩියා (Proboscidea) නමැති වර්ගයට අයත්ය. මෙම වර්ගයට අයත් සත්ව කාණ්ඩ 350 ක් පමණ වෙතත් ඔවුන් ගෙන් සත්ව කාණ්ඩ ඉතා වැඩි සංඛ්‍යාවක් අද වඳවී ගොසිනි. අලින් වර්ග දෙකක් ලොව අද වෙසෙනු දැකිය හැකිය. එම වර්ග නම් අප්‍රිකානු අලියා සහ ආසියානු අලියාත්ය. අප්‍රිකානු අලියා ආසියානු අලියාට වෙනස්ය. ඌ ප්‍රමාණයෙන් ආසියානු අලියාට වඩා විශාලය.

අලි ඇතුන් මීට වසර 500,000 කට පෙර සිට ශ්‍රී ලංකාවේ විසූ බව ශ්‍රී ලංකාවේ සිටි මුල් පෙළේ සත්ව විද්‍යාඥයකු වූ ආචාර්ය පී.ඊ.පී.දැරණියගල පවසයි.

ලංකාවේ අලි වර්ග තුනක් සිටි නමුත් ඔවුන් ගෙන් එලිපස් මැක්සිමස් සින්හලියුස් (Elephas, Maximus, Sinhaleyus)නමැති වර්ගය එලිපස් මැක්සිමස්(ElephasMaximus)ය එලිඵස් මැක්සිමස් විල්අලියාElephas Maximus Vilaliya)දැකිය හැක්කේ මහවැලි ගංගා ධරයේ පහළ කොටසේය.

අලි ඇතුන් සිටි බවට වාර්තා වන ලොව බටහිර දිගම රට වන්නේ සිරියාවයි. මහා ඇලෙක්සැන්ඩර් රජුගේ රාජ්‍ය කාලයට පෙර සිරියාවේ ක්‍රිස්තු පූර්ව 400 දී අලි ඇතුන් සිටි බව මෙසපොතේමියාවේ වාර්තාවල සඳහන් වෙයි. අතීතයේ අලි ඇතුන් පර්සියාව (ඉරාණය) ඇෆ්ගනිස්තානය, පාකිස්තානයේ දී සිටි බවට තොරතුරු ලැබී ඇත. ඉන්දියාව, නේපාලය බංග්ලාදේශය, බුරුමය, තායිලන්තය, වියට්නාමය සහ කාම්බෝජය යන රටවලද එලිපස් මැක්සිමස් වර්ගයේ අලි ඇතුන් අද ජීවත් වෙති.

අප අද දළ සහිත සත්වයන් ඇතුන් ලෙසත් දළ රහිත සතුන් අලින් ලෙසත් හඳුන්වනු ලැබුවත් පැරැණි සාහිත්‍යයේ අලින් හඳුන්වා ඇත්තේ ඇතුන් යන පදයෙනි. දළ සහිත සතුන් හඳුන්වන ලද්දේ දළ ඇතුන් ලෙසිනි. අපි ඇතුන් දෙවර්ගයේම ගැහැණු සතුන් හැඳින්වීමට යොදන ඇතින්න යන පදය දෙස බැලීමෙන් පැරැණි යෙදුම ගැන යම් අදහසක් ඇති කර ගත හැකිය අලින්ට "අලි" යන නම වැටෙන්නට ඇත්තේ මදු ගසා අලි ඇල්ලීමේ යෙදුන මුස්ලිම්වරුන්ගේ කණ්ඩායමක සිටි අලි නමැති අයකු හෝ එනම් තිබූ කිහිපදෙනකු නිසා වන්නට ඇත. අලි යන්න මුස්ලිම්වරුන් අතර බහුල පුද්ගල නාමයකි.

ක්‍රි.ව. 1800 දී පමණ මෙරට කැලෑවල විසූ අලින්ගේ සංඛ්‍යාව 12,000 ක් පමණවී යැයි ගණන් බලා තිබේ. ඒ යුගයේ අලින් වියලි සහ තෙත් කලාපවල පමණක් නොව කඳුකරයේ කැලෑවලද ජීවත්ව ඇත. බ්‍රිතාන්‍යයෝ 1850 දී පමණ රටේ තෙත් සහ කඳුකර පෙදෙස්වල කෝපි ද පසුව තේද රබර් ද වගාකිරීමට කැලෑ හෙළි පෙහෙළි කළහ.අලි රංචු සුද්දන්ගේ වගා විනාශ කිරීමට පටන් ගත් විට ඔවුන් කළේ ඉවක් බවක් නැතිව අලි වෙඩි තබා මරාදැමීමය. කෙටි කලක් ඇතුළත අලින් 550ට දෙනකු වෙඩි තබා මරා දැමූ බව එකල වාර්තාවල සඳහන් වෙයි. සිය වස් ගණනාවක් මදු ගසා අල්ලා අඩු කර ගැනීමට නොහැකි වූ අලි රංචු වෙඩි තැබීමෙන් ඉතා තදින් පහත දමා ගත හැකි විය. මරා දමන එක් අලියකු වෙනුවෙන් දඩයක්කරුවකුට සිලිං කිහිපයක තෑග්ගක් පිරිනැමීමෙන්ද සුද්දෝ අලි මැරීම වේගවත් කළහ.

දඩයම විනෝදයක් කර ගත් ඇතැම් සුද්දෝ විනෝදයට අලි මරා දැමුහ. ශ්‍රීමත් එම්ර්සන් ටෙනන්ට්ගේ "සිලෝන් ද වයිල්ඩ් එලිෆන්ට් ඇන්ඩ් නැචුරල් හිස්ට්‍රි" නැමැති 1867 වසරේදී ලියන ලද පොතෙහි, "අලි ගහණය පසුගිය වසරවල සෑහෙන පමණ පහත වැටුණ බව විශ්වාස කළ හැකිය. කලින් විශාල වශයෙන් ගැවැසුන පෙදෙස්වලින් ඔවුන් දැන් අතුරුදන්වී ඇත."

"කුඩා කණ්ඩායම් රජයේ අවශ්‍යතා සඳහා අල්ලා ගනු ලැබ ඇත. කඳුකර පෙදෙස්වල කෝපි වගාව සඳහා කැලෑ එළි කිරීමක් සමඟ ඔවුන් එම පෙදෙසේ අතහැර පහත් බිම් පෙදෙසට පැමිණියත් යුරෝපීය දඩයක්කරුවෝ ලොකු කණ්ඩායම් වශයෙන් ඔවුන් පසුපස හඹා යති. පෙරට වඩා සිංහලයන්ට නිදහසේ ගිනි අවි ලබාදී, ඇති නිසා වාර්ෂිකව සතුන් මරා දැමීම වර්ධනයවී ඇත."

මේජර් රොජර් නමැත්තා අලින් 1400 ක් මරා දමා ඇත. ඒ ගණනට අඩකට වැඩියෙන් කපිතාන් ගැලෝවි විසින් මරා දමා තිබේ. යැයි සඳහන් කළේ ය. අල්ලන ලද අලි විදේශයනට විකිණීම ගැන ශ්‍රී ලංකාවට කලකට ඉහත දී සිට ලොකු ප්‍රසිද්ධියක් තිබුණි. අලි වෙළෙඳාම ඕලන්ද සමයේ රජයේ ආදායම් මාර්ගයක් විය. ඉංගිරිසිහු 1882 න් පසුව අලි ඇල්ලීම අත්හැර දැමුහ. කෙසේවුවත් අලි ගාල් කර ඇල්ලීම ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසුවත් පැවැතිණි. අන්තිම ඇත් ගාල 1950 දසකය මුල පවත්වන ලද්දේ රත්නපුරේ පනාමුරේදිය. ඇත් රළේ නායක ඇතා රළේ සෙසු අලි ඇතුන් ගාලට අතුළුවීම වැළැක්වීම පිණිස ගාලේ දොරටුව අවහිර කර රැක සිටියේය. ඇත් ගාල පැවැත්වූ අය එම ඇතාට වෙඩි තබා දොරටුවේ අවහිරය ඉවත් කළහ. පනාමුරේ ඇත් රජා ලෙස ජනශ්‍රැතියට එක් වූයේ නම් කණ්ඩායම් අලි ඇතුන් මිනිස් අත්අඩංගුවට පත්වීමෙන් වළක්වා ගැනීමට උත්සාහ දැරූ එම ඇතාය.

විසි වන සියවස මුල භාගයේ දී දිවයිනේ කැලෑවල සිටි අලි ගහණය 2000 දක්වා අඩුවී තිබුණි. කෙසේවුවත් මදු ගසා අලි ඇල්ලීම 1960 දසකය මැද දක්වාම පැවතිණි. ඇමරිකාවේ සමිත් සෝනයන් ආයතනය මඟින් 1967 – 1970 කාලයේ පවත්වන ලද සමීක්ෂණයට අනුව රටේ අලි ගහණය 3000 ක් විය. අද අලි ගහණය 2000 දක්වා පහත වැටී තිබේ.

අලි ඇතුන් තව දුරටත් ආරක්ෂා කිරීම පිණිස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මෑතදී නීති රීති දැඩි කර ඇත. ආත්මාරක්ෂාව පිණිසවත් අලි ඇතුන්ට වෙඩි තබා මරා දැමීම දැන් තහනම්ය. අලි ඇතුන් ආරක්ෂා කිරීමට අදාල නීති රීති ගැන රජය ජනතාව දැනුවත් කර ඇති අතර ඒ සඳහා යහපත් ජනතා ප්‍රතිචාරද ලැබී ඇත.

ඉකුත් සිය වස මැද භාගයේ සිට වේගයෙන් වර්ධනය වූ ජනගහන අවශ්‍යතා සඳහා වියලි කලාපයේ අලුතින් ගොවි ජනපද පිහිටුවීම පිණිස කැලෑ එළි පෙහෙළි කිරීමත් සමඟ අලි ඇතුන් ගේ වාස භූමි සීමා වන්නට විය. තම වගා රැකගැනීම සඳහා අලි ඇතුන් මරා දැමූ ඉංගිරිසින් මෙන් නොව නිදහස් ශ්‍රී ලංකාවේ පාලකයෝ අලි ඇතුන් කෙරෙහි කරුණාව දැක්වූහ. නව ගොවි ජනපද පිහිටුවන ලද පෙදෙස්වල අලි ඇතුන් සහ අනෙක් වන සතුන් සඳහා ඔවුහු ජාතික වනෝද්‍යාන සහ අභය භූමි පිහිටු වූහ. එවැනි අභය භූමි අතර ගල්ඔය සේනානායක සමුද්‍රය පෙදෙසේ සේනානායක සමුද්‍ර අභය භූමිය, මින්නේරිය ගිරිතලේ වැව් ආශ්‍රිත මින්නේරිය ගිරිතලේ අභය භූමිය කතරගම සමීපයේ යාල අභය භූමිය සහ අනුරාධපුරය අසල විල්පත්තු අභය භූමියද මුල් තැන ගනියි. මාදුරුඔය, ජාතික වනෝද්‍යානය, වස්ගොමුව, සෝමාවති අභය භූමිය සහ මහවැලි ජලාධාර අභය භූමියත් මහවැලි යෝජනා ක්‍රමය යටතේ පිහිටුවන ලදී.

ගොවි ජනපද අවට කැලෑවල අලි ඇතුන් ඉවත් කිරීම පිණිස වනජීව දෙපාර්තමේන්තුව ක්‍රම දෙකක් භාවිත කරයි. පළමුවැන්න අලි ඇතුන් අභය භූමිවලට පළවා හැරීමයි. දෙවැන්න කුඩා අලි රංචු නිර්වින්දන කර අල්ලා ගෙන ගොස් දුර බැහැර අභය භූමිවලට මුදා හැරීමයි. කෙසේවුවත් මෙම ක්‍රම දෙකෙන්ම ලැබී ඇති ප්‍රතිඵල එතරම් උසස් නැත. පළවා හරින ලද හෝ මුදා හරින ලද අලි ඇතුන් තම නිජ බිම්වලට ආපසු පැමිණීම ඉහළ මට්ටමක පවතියි.

වලවේ වම් ඉවුරේ සිට ලුණුගම්වෙහෙර ජාතික අභය භූමියට මීට මාස කිහිපයකට ඉහත දී පළවා හරින ලද සිය ගණනක්වූ අලි රංචුවෙන් සෑහෙන පිරිසක් දැන් ආපසු පැමිණ ඇතැයි වාර්තාවල පළ විය. උඩවලවේ රංචුවේ ඇතැම් අලි උඩවලව - තණමල්විල මාර්ගයේ අලින් ජනාවාසවලින් වෙන් කරන විදුලි වැට අසලට අවුත් මහ මඟ යන එන්නන් ගෙන් හිඟමන් ඉල්ලති. අලින්ට ආහාර නොදෙන්නැයි සඳහන් දැන්වීම් පුවරු බල බලාම ජනතාව අලින්ට පලතුරු වර්ග දුර සිට විසි කරති. පොළොන්නරුව ප්‍රදේශයේ වී මෝල් හිමියන් ගෙන ගොස් දමන බොල් වී කෑමට පැමිණෙන අලි රංචු පොළොන්නරුව මනම්පිටිය මාර්ගයේ දීදැක ගත හැකිය.

ආහාර සහ ජලය සොයා වල් අලි ගම් වදිති. ඇතැම් අලි ගම්වැසියන්ගේ ජීවිතවලට හානි සිදු නොකළහ. වගා හානි සිදු කරති. අලින් ගම් වැදීම වැළැක්වීම පිණිස රජය කරන්නේ ගම්මාන සහ කැලෑ වෙන් කෙරෙන අයුරින් විදුලි වැට ඉදි කිරීමයි. කෙසේවෙතත් විදුලි වැට මතභේදයට තුඩු දී ඇති ඉදි කිරීමකි. වැට ඉදි කිරීම සහ විදුලිය සැපයීම රජය කරනු ලැබුවත් වැටේ නඩත්තුව ගම්වාසීන් විසින් කළ යුතුව ඇත. විදුලි වැට ඉදි කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවලද ආධාර ලැබෙයි. එවැනි සංවිධානවල මැසිවිල්ල වන්නේ ගම්වාසින් ඔවුන්ගේ යුතුකම් කොටස කලට වේලාවට ඉටු නොකරන බවයි. ගැමියන්ට නගරවල වසන සංවිධාන සාමාජිකයන්ට මෙන් කාල සටහන්වලට අනුව වැඩ කටයුතු කරන පුරුද්දක් නැත. ඔවුන්ට ඇත්තේ ජීවිතය ගැට ගසා ගැනීමේ අරගලයකි. එයට කාලයක් වේලාවක් නැත. ඒ කටයුතු අවසන් කරන විට විදුලි වැට නඩත්තු කිරීම අතපසුවී ගොස්ය. අනෙක් අතට සංවිධානවල සාමාජිකයන් වැඩි දෙනා නගරවාසීන්ය. අලි ඔවුන්ගේ නගරබද නිවෙස් කඩා දැමීමට නොඑන බැවින් ගම්වාසීන්ගේ පැත්තට නොව අලින්ගේ පැත්තට ඔවුන්ට ඕනෑ දෙයක් කතා කළ හැකිය. අලින්ට සිදු වන අලාබ හානි ගැන සලකන විට අලීන්ගේ පැත්තටද කතා කළ යුතුයි. එහෙත් අලින්ට පෙර මිනිසුන්ට වන අලාභය තක්සේරු කළ යුතුයි. අලින් සහ ගම්වාසීනුත් වෙන් කෙරෙන විදුලි වැට හිරවී ඇත්තේ එවැනි අර්බුදයකටය. දෙපැත්තෙන්ම වැරැදි විය හැකියි. එහෙත් අලින් වැට කඩා ගෙන ගම් වැදීමට ඉඩ තිබිය යුතු නැත.

අලින් වෙනුවෙන් කතා කරන වන සත්ව ලෝලීන් අලින් අල්ලා හිලෑ කිරීමට විරුද්ධය. ඔවුනට ඕනෑ අලි කැලෑවල හෝ අභය භූමිවල නිදැල්ලේ ගැවැසීමටය. එවිට ඔවුනට තම දරු පවුල් නැදෑ හිතවතුන් සමඟ සුඛෝපභෝගී වාහනවලින් පැමිණ අලි නැරඹිය හැකිය. අලින් ගන් කැලෑ අවට ගම්වල පාසල් යන දරුවන් සහ කාන්තාවන් ඇතුළු ගම්වාසීන්ගේ ප්‍රශ්න ගැන ඔවුන් තුළ එතරම් තැකීමක් නැත. අලි ඇතුන් ගෙන් සැලැසෙන ලාබ ප්‍රයෝජන සහ සිදුවන අලාභ හානි ගැන නොසලකා අලි ඇතුන් සංරක්ෂණය කර තබා ගැනීමටය.අලි ඇතුන් සංරක්ෂණය දෙපැත්තට යා හැකි මාර්ගයකි. මිනිසුනුත් අලි ඇතුනුත් ඒ මඟ ගමන් කළ යුතුව ඇත. දෙපක්ෂයටම එහි යෑමේ අයිතියද තිබිය යුතුය.

විසි වන සියවස මුල භාගයේ දී දිවයිනේ කැලෑවල සිටි අලි ගහණය 2000 දක්වා අඩුවී තිබුණි. කෙසේවුවත් මදු ගසා අලි ඇල්ලීම 1960 දසකය මැද දක්වාම පැවතිණි. ඇමරිකාවේ සමිත්සෝනයන් ආයතනය මඟින් 1967 – 1970 කාලයේ පවත්වන ලද සමීක්ෂණයට අනුව රටේ අලි ගහණය 3000 ක් විය. අද අලි ගහණය 2000 දක්වා පහත වැටී තිබේ.